# 1950 දශකයේ ශ්‍රී ලංකාවේ විශ්‍රාන්තිය

ආර්.ජේ. වාසනා ජයසේන

නීරස ජීවිතය තුලින් තම ජීවිත රසය සොයා ගිය මිනිසුන් පිළිබඳව අතිතය සාක්ෂි සපයයි. වසර 65 කට වඩා ඉපැරණි ලාංකීය ජන සමාජයේ දේශපාලන හා සමාජ යථාර්ථය තුළ මිනිසුන් ගෙවූ ජීවිතය කටුකය. එම කටුකත්වය තුළින් ඔවුන් තම වින්දනය සොයා ගිය තැන් අපමණය. දේශපාලනික මතවාද හා ගැටීම් තුළ දෝලනය වන මිනිසුන් ස්වභාව දහමට ඉඩ දී සමාජ යථාර්ථය සෙවූහ. ජීවිතයේ ඔවුන් ගෙවා දැමූ ඒකාකාරීත්වයේ මානසික පීඩනයෙන් මිදී මනස ප්‍රකෘතිමත් කළ සියුම් තැන් ඔවුන් මනාව ස්පර්ශ කළ හ. අවුල් වූ සමාජ ක්‍රමයෙන් මිදීමට ස්වභාව දහම රස විඳීමට ඔවුන්ට හැකි විය. දහසකුත් ගැටළු මැද ඔවුන් සෙවූ ඒ මානසික නිදහස විශ්‍රාන්තියක් ලෙසින් මීට වසර 65 කට පමණ පෙර සනිටුහන් විය. පරාජිත නොවූ විශ්‍රාන්ති ක්‍රියා පුද්ගල අපේක්ෂාවන් මැදි කර ගනිමින් ජීවිතය සැනසීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයකි, අපරාජිත වූ '' පරාජිතයෝ''...
ගෙය පිටුපසට වී සරුංගලයක් සාදමින් සිටි ගුණපාල හදිසියේ යමක් සිහිවූවක මෙන් ඉස්තෝප්පුවට පැමිණියේ ය.... නොඉවසිල්ලෙන් මෙන් දබර ඇඟිල්ලත් මැදඟිල්ලත් එක්කොට හිසකැසූ ගුණපාල හැරී ගේ පිටුපසට ගොස් සරුංගලයේ කොන් හතරේ ලණු බැඳ එය මුල්ලක සඟවා තබා යලිත් ඉස්තොප්පුවට අවේය... හවස ගෙදර ආවයින් පසු රෑට බත ඉදෙනා තුරු ඔහු පැත්තකට වී හික් මීයෙකු මෙන් කර බාගෙන ඉඳී. කෑම කා ස්වල්ප වේලාවක් මහ පාර දෙස බලා ඉඳීමෙන් පසු නින්දට යයි.... කුස්සියේ බිත්ති සියල්ලම දුම් බැඳි කපුටු පැහැරගෙන තිබූ නමුත් ඉස්තෝප්පුවේ බිත්ති මොන පාට දැයි බලා ගැනීමට නොහැකි තරමට එහි පින්තූර එල්ලා තිබිණ. ගෘහ මූලිකයාගේ පමණක් නොව ඔවුන්ගේ ඥාති මිත්‍රාදීන්ගේ මඟුල් පිංතූර ද ඒ අතර විය. පිංතූරවලින් නොවැසී කලාතුරකින් හෝ ඉතිරි වූ තැනක් වී නම් එය දින දර්ශනයකින් වැසී තිබිණ. සිනමා නළු නිළියෝ ඒවාට අරක්ගෙන සිටිය හ..... උදේට නගරයට පැමිණ සවස් වන තුරු යකඩ යන්ත්‍ර වල හැපෙන ඔවුන්ට සෞන්දර්ය පිළිබඳව අවබෝධයෙන් තොර හැඟීමක් ගෙන දෙන ලද්දේ මේ ගඟ විසිනි. නෑමට පමණක් එහි රොක් නොවුණු ඔවුහු ඇතැම් නිවාඩු දිනයක හෝ සැන්දෑවක ගං ඉවුරට රැස් වී කතා බහ කරමින් හා විහිළු තහළු කරමින් ප්‍රීති වන්නට ද පුරුදුව සිටිය හ. .......
ගඟ එක අතකින් ඔවුන්ට ස්වභාව ධර්මය කැටි කර දක්වන්නක් ද විය. සමහරු එහි ඔරු පාරු පැදීමෙන් ද , මසුන් මැරීමෙන් ද , ජීවිකාව ගෙන ගියහ. ඒ අතර තුර තවත් සමහරු ගඟ අද්දර මැට්ටෙන් වළං හෝ උළු, ගඩොල් සෑදූහ. වෙනත් ක්‍රමයකින් ජීවිතය ගෙන ගිය අය පවා නෑමට හා සේදීමට ගඟ දිය පාවිච්චි කළහ. ගඟ ඔවුන්ගේ සියලු කුලමල හා කිළුටු ගිල ගෙන නිහඬ ව ගාම්භීර ලෙස පහළට ගලා බැස්සා ය..... ගඟේ ඉවුර කවාකාරව බිඳී ජලය රොක් වීමෙන් තොටුපළ සෑදී තිබිණ. නොකඩවා මිනිසුන් නාන්නට බැසීම නිසා දෝ එහි යන පාර ගඟ අයිනේ දී ගං ඉවුරු බිඳ ගෙන දෙබුක්කාවක් තැනී තිබිණ...
එතැන අමුතු වින්දනයක් දෙන්නාක් මෙන් ඔහුට දැනිණ..... නාගෙන ආපසු එද්දී ඔවුන්ට මහත් බඩගින්නක් දැනිණ. හෙට්ටි වීදිය පෙදෙසට ගොස් දෙමළ කඩයකින් බත් කන්නට ඇන්තනී යෝජනා කළේ ය..... නොයෙක් දිනවල ඔහු ඉතා ලාභයට රස මසුවලෙන් යුත් ආහාර පාන සහිත දෙමළ මරක්කල කඩවලට යාළුවන් කැඳවාගෙන ගොස් ඇත.... සිරිත් පරිදි කලින් භෝජන සංග්‍රහය පවත්වා අවසානයෙහි ආලිංගන නුටමක් විය. නීතී විද්‍යාලයෙන් බැහැර අය ද අමුත්තන් සේ සම්භාෂණයට බැඳ ගත් හෙයින් සැලකිය යුතු කාන්තා පිරිසක් ද එහි විය. ඔවුන්ගෙන් වැඩි දෙනා කොළඹ නගරයේ මෙවැනි තැන් සොය සොයා යන අය වූහ. නීතී ශිෂ්‍යයන්ගෙන් බොහෝ දෙනෙක්ම තරුණියන් බදාගෙන විදුලි එළිය වැටීම නිසා බබළන විවිධ වර්ණයෙන් යුත් බැලුන් වලින් සරසන ලද සුරංගනා ලෝකයක් වැනි ශාලාවෙනි ඔබ මොබ පාවෙමින් නටන්නට වන් හ.... සම්භාෂනවලදී නාදුනන ලස්සන තරුණියන් අවුත් තමන් නැටුමට කැඳවීම පිළිබඳ පුවත් ඇත්තන් නොයෙක් විට ඔහුට කියා ඇත...... ඔහු ආලිංගනා නැටුම් උගන්නට ගියේ නීතී විද්‍යාලීය සම්භාෂණයම අරමුණු කර ගෙනය... ඔවුන්ගේ ඥාතී මිත්‍රාදීහූ එහි පැමිණ කා බී සතුටු වූහ. මේ සම්භාෂණ බාල් නැටුම් ආදිය පවත්වන ඇතැම් දිනවල චාලනීගේ ආච්චි සහ නැන්දා ද එහි ගොස් මෙහෙකරුවන්ට උදව් දෙති... මේසය උඩ නිසදැස් කවි පොතක් විය. එය වරක් උඩින් මත්තෙන් කියවන දැමූවකි.

කේ.ජයතිලක (1997) පරාජිතයෝ, (7 වැනි මුද්‍රණය), ශිලා ප්‍රින්ටින් වර්ක්ස්,305, ලියෝ මාවත, සිංහාරමුල්ල, කැලණිය.